ආර්ථික පුනර්ජීවනය හා දරිද්‍රතාවය තුරන් කිරීම සඳහා වන ජනාධිපති කාර්යසාධන බලකාය
பொருளாதாரப் புத்தெழுச்சி மற்றும் வறுமை ஒழிப்புக்கான ஜனாதிபதி செயலணி
**Presidential Task Force for Economic Revival and Poverty Alleviation**

මගේ අංකය : PTF/01/Circular/01
දිනය : 2021.08. 22

චක්‍රලේඛ අංකය : PTF/03-2021 (ii)

**සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන්/ දිසාපතිවරුන්**
**සහ ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත,**

**කොවිඩ් - 19 ව්‍යාප්තිය පාලනය කිරීම සඳහා රට තාවකාලිකව වසා දැමීම හේතුවෙන් ජීවනෝපාය අහිමි වී ඇති පවුල් සඳහා රු.2,000/= දීමනාවක් ගෙවීම**

කොවිඩ් - 19 ව්‍යාප්තිය පාලනය කිරීම සඳහා රට තාවකාලිකව වසා දැමීම හේතුවෙන් ජීවනෝපාය අහිමි වී ඇති පවුල් සඳහා රු. 2,000/=ක දීමනාවක් ගෙවීමට රජය තීරණය කර තිබේ.

මෙම දීමනාව ගෙවීම සඳහා රජයෙන් කිසිඳු දීමනාවක් නොලබන අඩු ආදායම්ලාභී ජීවනෝපාය අහිමි වූ පවුල් පමණක් තෝරා ගත යුතුය. ඒ අනුව, රාජ්‍ය සේවකයින්, විශ්‍රාමිකයින්, සමෘද්ධි ප්‍රතිලාභීන්, වැඩිහිටි, සියවස් පූර්ණ, ආබාධිත වැනි රජයේ මාසික දීමනාලාභීන් මේ සඳහා සුදුසුකම් නොලබයි.

මෙම ප්‍රතිලාභ ගෙවීමට අවශ්‍ය අතිරේක ප්‍රතිපාදන භාණ්ඩාගාරය විසින් දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත ලබා දී ඇත. ඒ අනුව, ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේ සහ ග්‍රාමීය කමිටුවේ සහාය ඇතිව ග්‍රාම නිලධාරී කොට්ඨාස මට්ටමින් සේවයේ නියුතු නිලධාරීන් මඟින් සෞඛ්‍ය මාර්ගෝපදේශවලට අනුගත වෙමින් සුදුසු ක්‍රමවේදයක් යටතේ ප්‍රතිලාභීන් සඳහා මෙම දීමනාව ගෙවීමට කටයුතු කළ යුතුය.

එම දීමනාව අදාළ ප්‍රතිලාභියා විසින් ලබාගත් බවට සහතිකයක් ලබා ගැනීමට කටයුතු කිරීම අත්‍යවශ්‍ය වේ.

ඇන්ටන් පෙරේරා
අග්‍රාමාත්‍ය අතිරේක ලේකම්
සම - ලේකම්, ආර්ථික පුනර්ජීවනය හා දරිද්‍රතාවය තුරන් කිරීම සඳහා වන
ජනාධිපති කාර්යසාධන බලකාය

**පිටපත්:**

කාරුණික දැන ගැනීම සඳහා:

1. ජනාධිපති ලේකම්
2. අග්‍රාමාත්‍ය ලේකම්
3. අමාත්‍ය මණ්ඩල ලේකම්
4. විගණකාධිපති

අවශ්‍ය කටයුතු සඳහා:

5. ලේකම්, මුදල් අමාත්‍යාංශය
6. ලේකම්, රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
7. ලේකම්, ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය
8. ලේකම්, සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය
9. අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අයවැය දෙපාර්තමේන්තුව
10. අධ්‍යක්ෂ ජනරාල්, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
11. ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව